# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2018 ඔක්තෝබර් මස 23 වන දින පෙ.ව. 9.30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන
II. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා
III. ලිපිලේඛන පිළිගැන්වීම
IV. කාරක සභා වාර්තා පිළිගැන්වීම.
V. පෙත්සම්
VI. ප්‍රශ්න / අතුරු ප්‍රශ්න

1. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් **2018.10.09** වන දින අසන ලද ප්‍රශ්නය; (ප්‍ර/ VI (1) / 18 /63)

ඇ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කොළඹ, ආනන්ද කුමාරස්වාමි මාවතේ පිහිටි ස්ථානයේ සිට, රන්මඟපාය දක්වා ගෙන ඒමට හේතු වූ කරුණු මොනවාද?

ආ) අධ්‍යාපන දෙපාර්තමේන්තුව පවත්වාගෙන ගිය, ග්‍රීන්පාත් යන ස්ථානයෙහි පිහිටි ගොඩනැගිල්ලෙහි අයිතිය ඇත්තේ කවරෙකු යටතේ ද?

ඇ) රන්මඟපායෙහි පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, පවත්වාගෙන යාම සඳහා කුලී ගෙවීමක් සිදු කරන්නෙහිද? එසේනම් ඒ සඳහා වැයකරනා මුදල කොපමණද?

ඈ) දැනට වසා දමා ඇති, ග්‍රීන්පාත් හි පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව පවත්වාගෙන ගිය ස්ථානය යොදා ගන්නේ කවර උවමනාවකටද?

2. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් **2018.10.09** වන දින අසන ලද ප්‍රශ්නය; (ප්‍ර/ VI (1) / 18 /64)

(අ) මීගමුව, නාගර සභා සීමාවේ, කොච්චිකඩේ, දිනපතා පොල පවත්වන ගොඩනැගිල්ලේ කොටසක් හදිසියේ කඩා දමා ඇති බව ඔබතුමා දන්නේද?

(ආ) ඒ හේතුවෙන් දිනපතා වෙළඳාම් කල වෙළෙඳුන් කොටසකට දැඩි අව් රශ්මියෙන් පීඩා විඳිමින් ඉතා අපහසුවෙන් වෙළහෙළදාම් කිරීමට සිදුව ඇති බව ඔබතුමා දන්නේද?

(ඇ) මෙම දිනපතා පොල පවත්වන ගොඩනැගිල්ල අලුතෙන් ඉදිකිරීමට යම් ආයතනයකින් මුදල් වෙන්කර තිබේද? එසේ නම්,

(i) වෙන්කල මුදල කොපමණද?

(ii) ගොඩනැගිලි සැලැස්මක් සකසා තිබේද?

(iii) එවැනි ඉදි කිරීමක් කරන්නේ නම් එය ආරම්භ කල හැක්කේ කවදාද?

(ඈ) ඉහත දිනපතා පොළ පැවැත්වූ ගොඩනැගිල්ල කඩා දැම්මට සභා වාරයකදී නගර සභා අනුමැතියක් දි ඇද්ද?

(ඉ) ඉහත ලෙස වගකිව යුතු ආයතනයක් ඉහත කී ගොඩනැගිල්ල කඩා දැමීමට අවසර දී නොමැත්තේ නම් එකී ගොඩනැගිල්ල කඩා දමා ඇත්තේ කාගේ වුවමනාවටද?

(ඊ) ඉහත ගොඩනැගිල්ල කඩා දැම්මෙන් මහජනතාවට හා දිනපතා වෙළදුන්ට සිදුව ඇති අපහසුතාව වැලැක්වීමට ඔබතුමා පියවර ගන්නේද?

(උ) නොඑසේ නම් ඒ මන්ද?

- <u>සභාව කල් තබන අවස්ථාවේ අසන ලද ප්‍රශ්න;</u>

3. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු ජල සම්පාදන හා ජල පවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් **2018.10.09** වන දින සභාව කල් තබන අවස්ථාවේ දී අසන ලද ප්‍රශ්නය,

(ප්‍ර/ VI (1) / 18 /ADG-05)

අ. බස්නාහිර පළාත් ආණ්ඩුකාර තනතුර වෙනුවෙන් නිල නිවසක් ඉදි කරමින් තිබේද?

ආ. ඉදිකිරීම් සිදු වන්නේ කුමන ස්ථානයක ද?

ඇ. ඇස්තමේන්තුගත මුළු මුදල කීය ද?

ඈ. ඉදිකිරීම් සිදු කරන ආයතනය කවරේද?

ඉ. ගොඩනැගිල්ල තට්ටු කීයකින් සමන්විත ද?

ඊ. අත්තිවාරම් සඳහා කොපමණ මුදලක් වැය කළේ ද?

උ. අත්තිවාරම් පයිල් (Pile) කිරීමට හේතු කවරේද?

4. ගරු උපාලි කොඩිකාර මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.10.09 වන දින සභාව කල් තබන අවස්ථාවේ දී අසන ලද ප්‍රශ්නය; (ප්‍ර/ VI (1) / 18 /ADG-06)

අ. බස්නාහිර පළාතේ දැනට ගුරු සේවයේ පුරප්පාඩු කීයක් තිබේද?

ආ. පත්වීම් නොලබා සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ පිරිස කොපමණද?

ඇ. 2014.08.08 ගැසට් නිවේදනය යටතේ පැවැත් වූ තරඟ විභාගයෙන් කී දෙනෙක් බඳවා ගෙන තිබේද?

ඈ. 2007 හා 2011 ලකුණු 80 ලබා ගත් සියලු දෙනාටම පත්වීම් ලබා දුන්නේ නම් 2014 විභාගය පවත්වා වසර 4 කට ආසන්න කාලයක් තුළ මෙම පත්වීම් ලබා නොදීමට හේතුව කුමක්ද?

ඉ. බස්නාහිර පළාත තුළ 3000කට අධික ප්‍රමාණයක ගුරු හිඟයක් පවතීද?

ඊ. එම හිඟයට මෙම පත්වීම් ලබා දිය නොහැකි ද? (සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ අයට)

උ. 2018.07.23 සිට 2018.07.31 දක්වා පැවති සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අය සඳහා පත්වීම් ලබා දෙන්නේ ද?

ඌ. 2014.12.27 වන දින සම්මුඛ පරීක්ෂණය සඳහා මුහුණ දුන් උපාධිධාරීන් හට පත්වීම් ලබා දීමට කටයුතු සිදු කරන්නේ ද?

5. ගරු සරත් පතිරණ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු, සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (ප්‍ර/ VI (1) / 18 /65)

අ. පසුගිය දිනවල අනුමත කරන ලද පරිපූරක ඇස්තමේන්තු මගින් අධ්‍යාපන අමාත්‍යාංශ විෂයයන්ට අදාල වැඩ,

(i) අනුමත කල ටෙන්ඩර් පටිපාටිය,

(ii) ටෙන්ඩර් සඳහා අයදුම් කල අය,

(iii) ටෙන්ඩර් වලට අනුව තෝරා ගත් අය,

(iv) තෝරා ගත් අයට ටෙන්ඩරය ප්‍රදානය කිරීමට හේතු,

(v) ඇස්තමේන්තු මුදල.

(vi) ටෙන්ඩරය ප්‍රදානය කළ මුදල.

පිළිබඳ වාර්තාවක් ලබා දෙන්නේද?

ආ. තවමත් ටෙන්ඩර් ප්‍රදානය නොකළ ව්‍යාපෘති මොනවාද?

ඇ. ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව සිදු කරන ව්‍යාපෘති තිබේද? ඒ මොනවාද?

6. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (ප්‍ර/ VI (1) / 18 /66)

අ. බස්නාහිර පළාත් විවිධ සේවා සමුපකාර සමිතිවල සේවයකර විශ්‍රාම ගිය සේවකයන්ට විශ්‍රාම වැටුපක් ලැබෙන ක්‍රමවේදයක් සැකැසී තිබේද?

ආ. කවර ක්‍රමවේදයකට ද?

ඇ. පළාත් සමුපකාර අමාත්‍යාංශය යටතේ විශ්‍රාම වැටුපක් ලබා දෙන ලෙස ඉල්ලා ඉල්ලීම් ඉදිරිපත් වී තිබේද?

ඈ. එම ඉල්ලීම්වලට අනුව පියවරක් ගත හැකිද?

ඉ. වාර්ෂික අය-වැයෙන් ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කළ හැකිද?

ඊ. වෙන් කළ හැකි නම්, 2019 අය-වැයෙන් මුදල් වෙන් කිරීමට පියවර ගන්නේද?

උ. නොඑසේ නම්, ඒ මන්ද?

7. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (ප්‍ර/ VI (1) / 18 /67)

අ. සී/ස පිළියන්දල බෝකුන්දර විවිධ සේවා සමුපකාර සමිතියේ වර්තමාන පාලනය යටතේ සිදු කරන ලදැයි කියන මුදල් වංචා, දූෂණ, අක්‍රමිකතා ගැන ඔබතුමාට, ඔබ අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වෙත පැමිණිලි ලැබී තිබේද?

ආ. පැමිණිලි ඉදිරිපත් කළ අය කවුරුන්ද?

ඇ. චෝදනා කවරේද?

ඈ. ඒ පිළිබඳව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද?

ඉ. ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, හේතු කවරේද?

8. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (ප්‍ර/ VI (1) / 18 /68)

අ. 2014.08.08 වෙනි දින ගැසට් නිවේදනය අනුව 2014 බස්නාහිර පළාත් උපාධි ගුරු විභාගය සමතුන් ගුරු සේවයට බඳවා ගැනීමේ දී මේ වන විට කොපමණ ලකුණු සංඛ්‍යාවක් දක්වා බඳවාගෙන තිබේද?යන්න සභාවට දන්වන්නෙහිද?

ආ. ලකුණු 80 සීමාව ඉක්ම වූ සියලු අය ගුරු සේවයට බඳවා ගන්නා බව දන්වා ඇති බව ඔබතුමා පිළිගන්නෙහිද?

ඇ. එම ප්‍රමාණය කොපමණද?යන්න ඔබතුමා සභාවට දන්වන්නෙහිද?

ඇ. එසේ එම සියලු දෙනා ගුරු සේවයට බඳවා ගැනීම සඳහා කොපමණ කාලයක් වැය වේ ද?යන්නත්, ඒ සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටිය කුමක් ද? යන්නත් සභාවට දන්වන්නෙහිද?

ඉ. නොඑසේ නම් ඒ මන්ද?

9. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (ප්‍ර/ VI (1) / 18 /69)

අ. ගනේමුල්ල - කඳාන ප්‍රධාන මාර්ගයේ බුළුගහගොඩ හා ගලහිටියාව අතර බස්නාහිර පළාත් සභාවේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉදිකරනු ලබන පාලමේ කොන්තාත්කරු කවුරුන්ද?යන්න ඔබතුමා සභාවට දන්වන්නෙහිද?

ආ. එකී පාලම ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද්දේ කවදාද? යන්නත්, කොපමණ කාලයකින් වැඩ අවසන් කළ හැකි ද?යන්න සභාවට දන්වන්නෙහිද?

ඇ. දිනපතා එකී මාර්ගය භාවිතා කරමින් විශාල පිරිසක් ගමන් කරන බවත්, මේ වන විට එකී පාලමේ වැඩ කටයුතු ඉතා මන්දගාමීව සිදු වන බවත්, ඔබතුමා දන්නෙහිද?

ඈ. එකී මාර්ගය භාවිතා කරන ජනතාව අපහසුතාවයන්ට පත් නොකර කඩිනමින් එකී පාලමේ වැඩ අවසන් කිරීම සඳහා ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද?

ඉ. නොඑසේ නම් ඒ මන්ද?

VII. පෞද්ගලික ප්‍රකාශ

VIII. වරප්‍රසාද කඩවීම් පිළිබඳ ප්‍රකාශ

IX. අමාත්‍යාංශ නිවේදන / අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
වරප්‍රසාද කඩවීම් පිළිබඳ පිළිතුරු

X. සභාවේ රැස්වීම්

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට

යෝජනාව :

" අද දින [2018.10.23] විසිරයෑමෙන් අනතුරුව, මෙම සභාව, 2018.11.05 [සඳුදා] දින, පෙ.ව. 09.30 ට රැස්විය යුතු අතර, 2018.11.06 [අඟහරුවාදා] දිනය සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් ලෙස සළකා ක්‍රියා කළ යුතුය."

# XI. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

## 01. ගුරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා:

"අද පවතින අධ්‍යාපන ප්‍රතිපත්ති නිසා දැඩි පීඩනයකට මහජනතාව පත් වී ඇති බව කිව යුතුය. දරුවන් පාසලට ඇතුලත් කිරීමේ දී පංතියක සිසුන් සංඛ්‍යාව 45 සිට 35 දක්වා ක්‍රම ක්‍රමයෙන් අඩු කරන ක්‍රමවේදයක් පවතී. දැනට පංතියක ළමයින් 07 ක් අඩු වී ඇත. ඒ වෙනුවෙන් පාසල් වල එක් පංතියක්වත් අලුතින් ඇති නොකිරීමෙන් සමාජයේ දැඩි අර්බුදයක් ඇති වී ඇති බව අධ්‍යාපන බලධාරීන්ට නොදැනේ. මේ පිළිබඳව අවධානය යොමු කර මෙම ක්‍රමය හේතුවෙන් පාසලක එක් එක් පංති වල අඩු වූ ළමයින් සංඛ්‍යාවට සරිලන නව පංති කාමර සංඛ්‍යාවක් සෑම කොට්ඨාසයකම ආරම්භ කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කර සිටියි."

(යෝ/ VI (1) / 18/06)

## 02. ගරු අජන්ත නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා:

"ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා දීම පෞද්ගලික අංශයේ ආයතන විසින් ඉතා සූක්ෂම ලෙස බස්නාහිර පළාත ඇතුලත හා දිවයින පුරාම ක්‍රියාත්මක වේ.

කණ්ඩායම් ණය සහ පෞද්ගලික ණය 40% වාර්ෂික පොලිය මත අය කර ගනියි. එය දැඩි අසාධාරණ සූරා කෑමකි. මෙම ණය ක්‍රමවේදය සම්බන්ධව මහ බැංකුවේ අධීක්ෂණය දැනට ප්‍රමාණවත් නොවන බැවින් මෙම තත්වය පිළිබඳව දැඩි අවධානය යොමු කොට මෙවැනි ණය ක්‍රම විධිමත් කිරීම සඳහා නව නීති, රෙගුලාසි කඩිනමින් සකස් කර ක්‍රියාත්මක කරන මෙන් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව, මුදල් අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් ඉල්ලා සිටියි."

(යෝ/ VI (1) / 18/08)

# XII. සභාව කල් තැබීම

එස්.එච්.ඩී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2018.10.10 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
11 වන මහල ,
බස්නාහිර පළාත් සභා කාර්යාල සංකීර්ණ නව ගොඩනැගිල්ල,
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
ශ්‍රී ජයවර්ධනපුර,
බත්තරමුල්ල.